## 2.10 මුස්ලිම් ප්‍රජාවගේ භූගෝලීය ව්‍යාප්තිය සහ ඔවුන් ආර්ථිකයට කරන බලපෑම (මාවනැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ඇසුරින්)

එම්.එම්. සාමලී අයෝමා මාරසිංහ - භූගෝල විද්‍යා අධ්‍යයන අංශය.

### ABSTRAT

ඈත අතීතයේ සිටම පර්සියානු සහ අරාබි ජාතිකයින් වෙළඳාම සඳහා රටින් රටට සංක්‍රමණය විය. රුවල් නැව් භාවිත කරමින් වෙළඳ කටයුතු කළ ඔවුහු එම රටවල වරායන් ආශ්‍රිතව පදිංචි වූහ. ශ්‍රී ලංකාවේද බේරුවල, ගාල්ල, කොළඹ, පුත්තලම සහ මන්නාරම යන ප්‍රදේශවල වරායන් කේන්ද්‍රකරගෙන මුල්ම ජනාවාස පිහිටුවාගෙන ඇත. මොවුන් ක්‍රමයෙන් පෘතුගීසි, ලන්දේසි, ඉංග්‍රීසි පාලන කාලයේදී රට අභ්‍යන්තරයට සංක්‍රමණය විය.

ශ්‍රී ලංකාවේ සුළු ජාතින් කොටසක් වන මුස්ලිම් ප්‍රජාව වර්ධනය වනවා පමණක් නොව දිවයිනේ විවිධ ප්‍රදේශවල ව්‍යාපතියක්ද පෙන්වයි. දිවයිනේ අනෙක් නගර වරධනය වන වේගයට සාපේක්ෂව මාවනැල්ල නගරය තුළද ඔවුන් සීඝ්‍රයෙන් වර්ධනය වේ. මෙවැනි තත්වයක් නිර්මාණය වීම සඳහා මුස්ලිම් ප්‍රජාවේ භූගෝලීය ව්‍යාප්තිය, ප්‍රදේශයේ ආර්ථිකයට දක්වන දායකත්වය සහ සිංහල හා මුස්ලිම් ප්‍රජාව අතර ඇති සම්බධතා අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ මූලික අරමුණ වේ. මාවනැල්ල ප්‍රදේශයෙන් හිගුල්ඔය ග්‍රාම නිලධාරි වසම ක්ෂේත්‍ර සමීක්ෂණය සඳහා යොදා ගන්නා ලදී. සසම්භාවී නියදි ක්‍රමයට අනුව නිවාස ඒකක වලින් 5% ක් ආවර්ණය වන පරිදි ප්‍රශ්නාවලියක් භාවිතා කළ අතර වෙළඳ ව්‍යාපාරිකයන්, ආයතන ප්‍රධානින්, ප්‍රජක තුමා සහ ප්‍රදේශයේ වැඩිහිටි ජනතාව සමග පැවැත්වූ සාකච්ඡා තුලින් ගත් තොරතුරුද මෙම පර්යේෂණය සඳහා උපයොගි කර ගන්නා ලදී.

මෙම ප්‍රදේශයට මුස්ලිම් ප්‍රජාවේ සංක්‍රමණය මීට වසර 800 කට පමණ පෙර සිදුවී ඇති අතර තුනකින් ආරම්භවූ මුස්ලිම් ජනාවාස 2005 වර්ෂය වන විට ග්‍රාම නිලධාරි වසම් 13 ක බහුතර ජනතාව බවට පත්වී ඇත. ප්‍රදේශයට දක්වන ආර්ථික දායකත්වය විමසීමේදී 1990 දී මුස්ලිම් වෙළඳසැල් ප්‍රමාණය මාවනැල්ල තුළ පමණක් සියයට 73.7 ක් විය. 2004 වන විට මේ ප්‍රමාණය සියයට 78.4 කි. මේ ප්‍රවනතාවය යටතේ 2025 වන විට මාවනැල්ල නගරයේ සියලුම වාණිජ කටයුතු මුස්ලිම් ප්‍රජාව අතට පත්වනු ඇතැයි උපකල්පනය කළ හැකිය.